# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,828 — 1959 අගෝස්තු 7 වැනි සිකුරාද — 7.8.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


## IV වැනි කොටස – පළාත් පාලනය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | — | අය-වැය ලේඛන ... ... | 664 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | — | දේපළ විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 661 | මාගී කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... | — |


## අතුරු ව්‍යවස්ථා

ඇල්. ජී. ඩී.—ජීඒ. 11/27/3.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ කන්ද පල්ල කෝරළේ ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව, 1947 තේ සැප්තැම්බර් මස 24, වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමිය කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමිය විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 ක් වූ ජූලි මස 10 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථා

1. කාර්ය සභාව විසින් සම්මත කර ගන්නා ලද පොදු ආදශී අතුරු ව්‍යවස්ථාවල VII හා XII වැනි කාණ්ඩවල සඳහන් අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරණ ලද සෑම බලපත්‍රයක්ම, එකී අතුරු ව්‍යවස්ථා යටතේ කලින් අවලංගු නොකරණ ලද්දේ නම් මිස නැතිනම් එකී බලපත්‍රය නිකුත් කරන ලද වෂීයේ දෙසැම්බර් මස තිස්එක්වන දිනට එය අවලංගු වන්නේ ය.

2. කාර්ය සභාව විසින් සම්මත කරගන්නා ලද පොදු ආදශී අතුරු ව්‍යවස්ථාවල VII, X, XI, XII, XIII, XV, XVI, XVII, XVIII, XXVI, හා XXVII යන මේ කාණ්ඩවල සඳහන් අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම ගම්කාර්ය සභාව විසින් ඒ සඳහා සපයා ඇති ආකෘති පත්‍රයේ ප්‍රකාරයට සකස්වියයුතුවාත් හැර—

(අ) එකී ඉල්ලුම් පත්‍රය අළුත් බලපත්‍රයක් සම්බන්ධයෙන් නම්, එකී බලපත්‍රය අවශ්‍ය ව්‍යාපරය පටන් ගැනීමට තිස් දිනකට කලින් හා,

(ආ) එකී ඉල්ලුම් පත්‍රය දැනට තිබෙන බලපත්‍රයක් අළුත් කිරීම සම්බන්ධයෙන් නම්, බලපත්‍රය අවශ්‍ය අවුරුද්දට කලින් අවුරුද්දේ සැප්තැම්බර් මාසේ පළමු වෙනි දිනට හෝ ඊට මත්තෙන් එකී ඉල්ලුම් පත්‍රය ප්‍රධාන තුමා වෙත ඉදිරිපත් කර සිටිය යුතුද වන්නේ ය.

3. කාර්ය සභාව විසින් සම්මත කරගන්නාලද, "පොල් ලෙලි පෙඟ වීම සඳහා (පොල් ලෙලි) කොටු" සම්බන්ධයෙන්වූ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල XXI වැනි කාණ්ඩය, එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාව එක්කම ඊළඟට පහත සඳහන් අළුත් අතුරු ව්‍යවස්ථා එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරණු ලැබේ. එනම් :—

"2. 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරණ ලද සෑම අවසර පත්‍රයක්ම, එය නිකුත් කරණ ලද අවුරුද්දේ දෙසැම්බර මාසයේ තිස් එක් වැනිදාට අවසාන වන්නේ ය.

3. 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ අවසර පත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම, ගම්කාර්ය සභාව විසින් ඒ සඳහා සපයා ඇති ආකෘතිපත්‍රයේ ප්‍රකාරයට සකස්විය යුතුවාත් හැර—

(අ) එකී ඉල්ලුම් පත්‍රය, අළුත් අවසර පත්‍රයක් සම්බන්ධයෙන් නම් පොල් ලෙලි කොටුව සෑදීමට අදහස් කොට ඇති දිනට පෙර තිස් දිනකට කලින් හා,

(ආ) එකී ඉල්ලුම් පත්‍රය දැනට තිබෙන අවසර පත්‍රයක් අළුත් කිරීම සම්බන්ධයෙන් නම්, එකී අවසර පත්‍රය අළුත් කිරීමට අවශ්‍ය අවුරුද්දේ සැප්තැම්බර් මස පළමුවැනිදිනට හෝ ඊට මත්තෙන් ද, එකී ඉල්ලුම් පත්‍රය ප්‍රධානතුමා වෙත ඉදිරිපත් කර සිටිය යුතු වන්නේ ය.

4. 1958 වේ මැයිමස 30 වැනි දින අංක 11,328 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරණ ලද අතුරු ව්‍යවස්ථා, එහි 8 වැනි අතුරු ව්‍යවස්ථාවේ "රෙදි අපුල්ලන ස්ථානය" යන ශිර්ෂය යටතේ, එහි 2 වැනි ඡේදය එක්කම ඊළඟට පහත සඳහන් අළුත් ඡේදය යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. එනම් :—

"(3) (1) වැනි ඡෙදය යටතේ අවසර පත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම ගම්කාර්ය සභාව විසින් ඒ සඳහා සපයා ඇති ආකෘතිපත්‍රයේ ප්‍රකාරයට සකස්වියයුතුවාත් හැර—

(අ) එකී ඉල්ලුම් පත්‍රය, අළුත් බලපත්‍රයක් සම්බන්ධයෙන් නම් එකී අවසර පත්‍රය අවශ්‍ය රෙදි අපුල්ලන ස්ථානයක් තබා ගැනීමේ ව්‍යාපාරය පටන් ගැනීමට තිස්දිනකට කලින්, හා

(ආ) එකී ඉල්ලුම් පත්‍රය දැනට තිබෙන අවසර පත්‍රයක් අළුත් කිරීම සම්බන්ධයෙන් නම්, අවසර පත්‍රය අවශ්‍ය අවුරුද්දට කලින් අවුරුද්දේ සැප්තැම්බර මස පළමු වැනි දිනට හෝ ඊට මත්තෙන් ද, එකී ඉල්ලුම් පත්‍රය ප්‍රධාන තුමා වෙත ඉදිරිපත් කළයුතුද වන්නේ ය.

5. මේ අතුරු ව්‍යවස්ථාවල :—

"ප්‍රධානතුමා" යනුවෙන් කාර්ය සභාවේ ප්‍රධානතුමා අදහස් කරණු ලැබේ.

"කාර්ය සභාව" යනුවෙන් මාතලේ දිස්ත්‍රික්කයේ කන්ද පල්ලෙ කෝරළේ ගම්කාර්ය සභාව අදහස් කරණු ලැබේ.

---

ජී. බී. 14/43/4.

## ගම්සභා ආඥාපණත

ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡෙදයේ) 49 වැනි වගන්තිය යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ නෙටොල්පිටිය ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව 1947 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශොධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යතුමිය කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමිය විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 යේ ජූලි මස 8 වැනි දින,
කොළඹදීය.

### රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද

1. (1) ආඥාපණතේ 47 වැනි වගන්තිය යටතේ අයකරනු ලබන රථවාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත්වූ යම් රථවාහනයක් හෝ සතකු අයිතිව හෝ බාරව හෝ පාලනයෙහි තබාගෙන හෝ සිටින්නාවූ සෑම අයෙකු විසින්ම සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් "ඒ" උපලේඛනයෙහි දැක්වෙන ෆෝර්මයේ ප්‍රකාර විස්තර උපලේඛනයක් ප්‍රධාන තුමාට සැපයිය යුතුයි. මේ ෆෝර්ම ගම්කාර්ය සභා කාර්යාලයෙන් ලබාගත හැකිය.

(2) ආඥාපණතේ 47 වැනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳී සිටින අය විසින් 1959 වර්ෂය වෙනුවෙන් (1) වැනි ඡෙදයේ සඳහන් උපලේඛනය සම්පූර්ණ කොට 1959 අගෝස්තු මස 15 වැනි දින හෝ ඊට මත්තෙන් ප්‍රධාන තුමා වෙත යැවිය යුතුයි. එකී අය ඒ වාහනය හෝ සතා හෝ අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන සිටින්නාවූ ඊට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන්වත් එකී අය ගෙන් එබඳු උප ලේඛනයන් අවශ්‍ය නැත.

2. ආඥාපණතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවාවූ සෑම අයෙක්ම තවදුරටත් දැනුම්දීමක් නැතිව ;

(අ) උපලේඛනයේ සඳහන් රථවාහන හා සතුන් සඳහාවූ බද්ද 1959 අවුරුද්ද වෙනුවෙන් ඒ අවුරුද්දේ සැප්තැම්බර මස 30 වෙනිදා හෝ ඊට මත්තෙන් ගෙවීමට යටත් වෙති. තවද,

(ආ) ඊටපසු එක් එක් වර්ෂය වෙනුවෙන් ඒ උපලේඛනයේ සඳහන් කරන ලද්දුව එකී වර්ෂයේ දවස් තිහකට වැඩි කාලයක් තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ එකී රථවාහන හා සතුන් සඳහා වූ බද්ද එකී එක් එක් අවුරුද්දේ මාර්තු මස 31 වෙනි දා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති.

3. 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උප ලේඛනය සැපයුවාට පසු යම් කිසිවෙකු විසින් ඒ උප ලේඛනය සඳහන් නොකරන ලද්දාවූ ද ආඥා පනත යටතේ බද්දට යටත්වූද යම් රථවාහනයක් හෝ සතකු අත්පත් කරගෙන තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේනම් එක්කෝ ඉහතින් සඳහන් 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් උපලේඛනයක් සපයා නැත්තාවූ යම්කිසිවෙකු විසින් එකී බද්දට යටත් යම් රථවාහනයක් හෝ සතකු පළමුවෙන් අත්පත් කරගෙන තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් එවිට ඒ අය විසින් එබඳු යම් රථවාහනයක් හෝ සතකු අත්පත් කර ගැනීමේ හෝ තබාගැනීමට නොහොත් පාවිච්චි කිරීමට පටන් ගැනීමේ දින සිට එක මාසයක් ඇතුළත දී සාමාන්‍යයෙන් මීට යාකොට ඇති "ඒ" උපලේඛනයේ සඳහන් ෆෝර්මයේ ප්‍රකාරයට ලියවිල්ලකින් වූ දන්වීමකින් එසේ අත්පත් කර ගත්බව ප්‍රධාන තුමාට දැනුම් දිය යුතුයි.

4. ආඥාපණතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය සැපයුවාවූ සෑම අයෙක්ම එකී ලේඛනය සැපයූ අවුරුද්ද වෙනුවෙන් ද ඊට පසු සෑම අවුරුද්දක් වෙනුවෙන් ද එකී ලේඛනයේ සඳහන් කරනු ලැබ තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ රථවාහන හා සතුන් සඳහා වූ බද්ද ඒ සඳහා ප්‍රධාන තුමා විසින් තමාට දැනුම් දෙනු ලබන යම් කාල සීමාවක් ඇතුළතදී ගෙවීමට බැඳී සිටිති.

5. (1) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය හෝ සැපයූවාට පසු ඒ උප ලේඛනයට ඇතුළත් කළාවූ හෝ ලේඛනයේ සඳහන් කළාවූ හෝ යම් රථ වාහනයක් හෝ සතකු සම්බන්ධයෙන් වූ බද්ද ගෙවීමට බැඳීමෙන් ආඥාපණතේ 47 (3) වැනි වගන්තිය යටතේ තමා නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින සෑම අයකු විසින්ම එසේ නිදහස් කිරීමට කියා සිටින්නේ අසවල් අසවල් කාරණා නිසායයි දැක්වෙන ලියවිල්ලකින් වූ දන්වීමක් වහාම ප්‍රධාන තුමා වෙත යැවිය යුතුයි.

(2) (1) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය හෝ සැපයූවාට පසු ඒ රථ වාහන හෝ සතුන් තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළා වූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම් අත්හැරියාවූ සෑම අයෙකු විසින්ම ලියවිල්ලකින්වූ දන්වීමකින් තමා ඒ සතා හෝ රථ වාහනය තබාගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළ බව නොහොත් ඒ ගැන අයිතිවාසිකම් අත්හළ බව වහාම ප්‍රධාන තුමා වෙත ලිය විල්ල කින් දැනුම් දිය යුතුයි. තවද ඔහු විසින් එකී රථ වාහනය හෝ සතා හෝ වෙනත් අයකු වෙත මාරුකරන ලද්දේ නම්, එසේ මාරු කරන ලද අයගේ නම සහ ලිපිනය ද ලියවිල්ලකින් ප්‍රධාන තුමා වෙත දැනුම්දිය යුතු ද වන්නේ ය.

6. (1) යම් කිසිවෙකු විසින් බද්ද ගෙවූ විට ප්‍රධාන තුමා විසින් ඒ බද්ද ගෙවූ රථවාහන වෙනුවෙන් ඒ අයට පහත සඳහන් උප ලේඛනයෙහි "බී" ෆෝර්මයෙහි ප්‍රකාරයට ඒ ඒ රථවාහන සඳහා වෙන් වෙන් වශයෙන් යොදා ඇති විශේෂ අකුරුද, තහඩුද, නිකුත් කරන අවුරුද්ද දැක්වෙන ඉලක්කම්ද රථවාහන රෙජිස්ටරයේ ඒ ඒ රථවාහනය පිළිබඳ වූ අංකයද සටහන් කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුයි. (2) මෙම අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡෙදයේ සඳහන් යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙනයම් ලෙසකින් හෝ නොපැහැදිලිව නොහොත් මැකීගොස් තිබෙතොත් ඒ තහඩුව අයිති කාරයා විසින් එය ප්‍රධාන තුමාට භාරදිය යුතුයි. තවද ඔහු විසින් ශත 50ක් ගෙවූ විට අළුත් තහඩුවක් නැවත ලබාගැනීමට අයිතිවාසිකම් තිබේ. (3) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදයේ සඳහන් යම් තහඩුවක් නැතිවී හෝ සොරාගෙන තිබෙන බැව් දිවුරුම් සහතිකයකින් හෝ වෙනයම් ලෙසකින් ප්‍රධාන තුමාට ඒත්තු ගැනීමට සැලැස් සුවහොත් එතුමා විසින් අයිති කාරයාගේ ඉල්ලීම පිටත් ඔහු විසින් ශත 60ක් ගෙවනු ලැබූ විටත් අළුත් තහඩුවක් නිකුත් කළ හැකිය.

7. (1) සෑම රථවාහන අයිතිකරු විසින් හෝ භාරකරු විසින්ම 6 වැනි ව්‍යවස්ථාව යටතේ ඒ රථවාහනය වෙනුවෙන් නිකුත් කරන ලද තහඩුව ඒ රථවාහනයේ කාටත් පෙණෙන තැනක සවිකළ යුතුයි.

(2) එක් රථවාහනයක් සම්බන්ධයෙන් 6 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද තහඩුවක් වෙනත් කිසියම් රථවාහනයක සවිකළ යුතු නැත.

8. ප්‍රධාන තුමා විසින් හෝ ප්‍රධාන තුමා විසින් ඒ සඳහා බලය දෙන ලද කිසියම් කෙනෙකු විසින් හෝ, අවශ්‍ය නම්, ගම් මුලාදෑනියෙකුගේ හෝ පොලිස් නිලධාරියෙකුගේ හෝ සහායයද ඇතිව, බද්ද ගෙවිය යුතු කිසියම් රථවාහනයක් හෝ සතෙකු හෝ කිසිවෙකුට අයිතිව හෝ කිසිවකුගේ භාරයේ හෝ කිසිවකුගේ පාලනය, හෝ තිබේද යන වග සොයා දැන ගැනීම පිණිස පෙරවරු 8 හා පස්වරු 5 ටත් අතර කාලය ඇතුළතදී ඔහුගේ ඕනෑම ඉඩමකට හෝ ගොඩනැගිල්ලකට හෝ ඇතුළත්විය හැකි වාත් හැර, එකී ඉඩම හෝ ගොඩනැගිල්ල භාරව සිටින අය විසින්, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සවකීය බලතල ක්‍රියාවෙහි යෙදවීම සඳහා ප්‍රධාන තුමාට හෝ එකී වෙනත් නිලධාරියාට හෝ අවශ්‍ය යම්යම් පහසුකම් සළසාදිය යුතුද වන්නේ ය.

9. ප්‍රධාන තුමා විසින් හෝ එතුමාගේ ලියවිල්ලකින් බලයලත් ඕනෑම නිළධාරියෙකු විසින් හෝ ඕනෑම මාවතක හෝ පාරක ගමනා ගමනයෙහි යෙදී තිබෙන රථවාහනයක් ඒ වාහනයෙහි 7 වැනි අතුරු ව්‍යවස්ථාවේ ප්‍රකාර සවිකොට තිබිය යුතුවූ තහඩුව පරීක්ෂාකර බැලීම පිණිස නවත්වා නතර කිරීම නිත්‍යානුකූල වන්නේ ය. තවද ප්‍රධාන තුමා විසින් හෝ එකී නිළධාරියා විසින් ඉල්ලීමක් කර සිටි කල්හි එකී ඕනෑම රථයක භාරකාරයා විසින් හෝ ඒ රථය පදවන්නා විසින් ඒ රථය නවත්වා ප්‍රධාන තුමාට හෝ එහි නිළධාරියාට එකී තහඩුව පරීක්ෂාකර බැලීමට ඉඩදිය යුතුයි.

10. මේ අතුරු ව්‍යවස්ථාවල :—

"ප්‍රධානතුමා" යනුවෙන් කාය්‍ර්‍ය සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ.

"කාය්‍ර්‍ය සභාව" යනුවෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ නෙටොල් පිටිය ගම් ප්‍රදේශයේ ගම් කාය්‍ර්‍ය සභාව අදහස් කරනු ලැබේ.

"ආඥාපනත" යනුවෙන් ගම් සභා ආඥාපණත (198 වෙනි පරිච්ඡේදය අදහස් කරනු ලැබේ.

11. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඇතැම් ගම්කාර්ය සභා විසින් සම්පාදිතව, 1944 ජේ ජූනි මස 2 වැනි දින අංක 9,276 දරණ ගැසට් පත්‍රයේ පළවූ රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන්වූ අතුරු ව්‍යවස්ථා මේ අතුරු ව්‍යවස්ථා අවලංගු කිරීමෙන්, ඒවා නෙටොල් පිටිය ගම් ප්‍රදේශයට පමණක් අදාළවන පරිද්දෙන් මෙයින් සංශෝධනය කර සිටිනු ලැබේ.

## 'ඒ' උපලේඛණය

### නොටොල් පිටිය ගම්කාර්ය සභාව

රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන්වූ අතුරු ව්‍යවස්ථාවල ප්‍රකාර සැපයිය යුතු රථවාහන හා සතුන් පිළිබඳ ලේඛනයයි.

අයිතිකරුගේ හෝ හිමිකරුගේ නම :—

ජන්දදායක කොට්ඨාශයේ අංකය :—

ලිපිනය :—

| රථවාහන හා/*හෝ සතුන් පිළිබඳ විස්තරය | ගණන (වචන වලින්) | වෙනත් විස්තර (බයිසිකලයක් නම් සාදන ලද අයගේ නොම්මරය සඳහන් කරනු) |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින් රිකෂෝ හැර ඕනෑම අන්දමක වාහන ... | | |
| ගොන් දෙන්නා බඳින බර කරත්ත හෝ ඕනෑම අන්දමක තිරික්කල ... | | |
| තනි ගොනා බඳින බරබාග කරත්ත හෝ තිරික්කල ... | | |
| ජින් රිකෂෝ රථ ... | | |
| අත් කරත්ත ... | | |
| බයිසිකල් ... ... | | |
| අලි ... ... | | |
| අශ්වයෝ ... ... | | |
| අශ්වතරයෝ ... ... | | |
| බූරුවෝ ... ... | | |

ඉහත සඳහන් විස්තරය සත්‍ය බවත් නිවැරැදි බවත් මම මෙයින් ප්‍රකාශකර සිටිමි.

————.

අයිතිකාරයාගේ අත්සන.

දිනය :————.

* නුවුවමනා වචන කපා හරින්න.

## "බී" උපලේඛණය

කරත්තයක්, තිරික්කලයක් හෝ ජින් රික්ෂෝ රථයක් හැර වෙන ඕනෑම අන්දමක වාහනයක් සඳහා ... නෙ. ත. ක.

සෑම (ගොන් දෙන්නා බඳින) බරකරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... නෙ. බ. ක.

සෑම තනිගොනා බඳින බරබාග කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... නෙ. ත. ක.

සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... නෙ. රි.

සෑම බයිසිකලයක් සඳහා ... ... නෙ. බ.

සෑම අත් කරත්තයක් සඳහා ... නෙ. අ.

---

ඇල්. ඩී—බී 15/59

ඇල්. ජී. ඩී.—ජී. ඒ 11/49/1.

## ගම්සභා ආඥාපණත

ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ බදුළු දිස්ත්‍රික්කයේ මැදගම්පත්තු ගම් ප්‍රදේශයේ ගම් කාය්‍ර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පලාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමිය කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමිය විසින් අනුමත කරණ ලද අතුරු ව්‍යවසථා.

වී. සී. ජයසූරිය,
පලාත් පාලන සහ නිවාස පිළිබඳ අමාත්‍ය
කාය්‍ර්‍යාංශයේ සථාවර ලේකම් තැන.

1959 යේ ජූලි මස 10 වැනි දින,
කොළඹදීය.

අතුරු ව්‍යවස්ථාව

### අන්තරාදායකවූ හා අප්‍රසන්නවූ කර්මාන්ත පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. පහත දැක්වෙන කර්මාන්ත අන්තරාදායකවූ කර්මාන්ත වශයෙන් සළකනු ලැබේ :—

(1) කොප්පරා සෑදීම ;

(2) කබුක් ගල්, බොරළු හෝ කළුගල් ලබාගැණීමට ගල්වළවල් කැපීම ;

(3) කපාපු පොල් වියලා සකස් කිරීම ;

(4) කොප්පරා ගබඩා කිරීම ;

(5) මීරන් වියලා සකස් කිරීම හෝ ගබඩා කිරීම ;

(6) යන්ත්‍ර සූත්‍ර මාගීයෙන් හෝ සෙක්කුවෙන් පොල්තෙල් සිඳීම ;

(7) පැඟිරි තෙල් සිඳීම ;

(8) කෙඳි වගී නෙලීම සහ ගබඩා කිරීම ;

(9) කුරුඳු තෙල් සිඳීම ;

(10) කපු පුළුන්, නූල් ආදිය ගබඩා කිරීම ;

(11) දර මඩුවක් තබාගැනීම ;

(12) ලී මඩුවක් තබාගැණීම ;

(13) වඩු මඩුවක් තබාගැණීම ;

(14) සවර්ණාභරණ සෑදීම ;

(15) කම්හලක් තබාගැණීම ;

(16) භූමි තෙල් ගබඩාවක් තබා ගැණීම ;

(17) මුද්‍රණ යන්ත්‍රාලයක් තබාගැණීම ;

(18) තේ කර්මාන්ත ශාලාවක් තබාගැණීම ;

(19) අම්ලකර වායුව යොදා ලෝකුරු වැඩ කිරීම ;

(20) හාල් මෝලක් තබාගැණීම ;

(21) පිදුරු ගබඩා කිරීම ;

(22) වළක් කැණීමෙන් හුණුගල් හෑරීම ;

(23) බයිසිකල් අළුත්වැඩියා කිරීම සඳහා වැඩපොළක් තබාගැණීම ;

(24) මෝටර් රථ අළුත්වැඩියා කිරීම සඳහා වැඩපොලක් තබා ගැණීම ;

(25) ගෘහ භාණ්ඩ සෑදීම ;

(26) ලී ඉරන මෝලක් තබාගැණීම.

2. පහත දක්වෙන කර්මාන්ත අප්‍රසන්න කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) ජාඩි හෝ කරවල ගබඩා කිරීම ;

(2) තොග ගණනේ විකිණීම පිණිස නරක්වන සුළු ආහාර හෝ ආහාර ද්‍රව්‍ය තබාගැණීම ;

(3) මිරිස් සහ වෙනත් තුනපහ වර්ග යන්ත්‍ර සූත්‍ර මාර්ගයෙන් ඇඹරීම ;

(4) කොම්පෝස්ට් පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීම හා ගබඩා කිරීම ;

(5) විනාකිරි සෑදීම ;

(6) සබන් සෑදීම ;

(7) හම් පදම් කිරීම සඳහාවූ ස්ථානයක් තබාගැණීම ;

(8) පුවක් වියලා සකස්කිරීම හා ගබඩා කිරීම ;

(9) සතුන්ගේ හම් ගබඩා කිරීම ;

(10) සතුන්ගේ ලේ හෝ මලකුණු උණුකිරීම ;

(11) සතුන්ගේ ඇටකටු ගබඩා කිරීම ;

(12) මාලු අයිස් දැමීම ;

(13) ලැලි පොඟවා සකස් කිරීම ;

(14) රබර් ෂීට් හෝ ක්‍රේප් රබර් දුම් ගැස්සීම් හෝ සෑදීම ;

(15) කෘත්‍රිම පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය හෝ ගෝනි තුනකට වඩා ගබඩා කිරීම ;

(16) කෝඩා සෑදීම ;

(17) දුම්කොළ වියලා සකස් කිරීම හා ගබඩා කිරීම ;

(18) සුරුට්ටු සෑදීම ;

(19) පැණි හකුරු සෑදීම ;

(20) රා එකතු කිරීමේ ස්ථානයක් තබාගැණීම ;

(21) කිඩ් සෑදීම.

3. පහත දක්වෙන කර්මාන්ත අන්තරාදායකවූ ද අප්‍රසන්නවූ ද කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) කෙඳි සායම් කිරීම ;

(2) ගඩොල් හෝ උළු පිලිස්සීම ;

(3) මැටි බඳුන් සෑදීම ;

(4) බැටරි චාජ් කිරීම ;

(5) හුණුගල් පිච්චීම, ගබඩා කිරීම, සකස් කිරීම, හෝ කුඩා කැබලිවලට කැඩීම.

---

# අය-වැය ලේඛන

## කොලොන්නාව නගර සභාව

## 1959 වර්ෂයේ අතිරේක වැය ලේඛනය

| වැය ශීර්ෂය | | මුදල රු. | ශ. | සභා අනුමතිය | |
|---|---|---|---|---|---|
| ඒ.2(බී) | ගමන් වියදම | 3,000 | 0 | අංක 10, මහ සභාව | 13. 7.59 |
| ඒ. 2 (ඊ) | නඩු වියදම | 1,000 | 0 | අංක 9, මහ සභාව | 8. 6.59 |
| | එම | 2,500 | 0 | අංක 10, මහ සභාව | 13. 7.59 |
| ඒ.4 | දයක මුදල් | 250 | 0 | අංක 9, මහ සභාව | 8. 6.59 |
| බී. 2 | මාර්ග නඩත්තුව | 2,000 | 0 | අංක 11, මහ සභාව | 17. 4.59 |
| | එම | 25,000 | 0 | අංක 10, මහ සභාව | 13. 7.59 |
| බී. 8 | මාර්ග වැඩිදියුණුව | 6,000 | 0 | අංක 10, මහ සභාව | 13. 7.59 |
| ඩී.4 | ගොඩනැගිලි නඩත්තුව | 3,000 | 0 | අංක 10, මහ සභාව | 13. 7.59 |
| ඊ.2 (බී) | ගොනුන්, කරත්ත හා ලොරි | 7,000 | 0 | අංක 10, මහ සභාව | 13. 7.59 |
| ඊ. 3 (බී) | එම | 10,000 | 0 | අංක 10, මහ සභාව | 13. 7.59 |
| ඊ. 5 (ඒ) | වතුරබෙදීම පඩිනඩි | 7,500 | 0 | අංක 3, මහ සභාව | 17. 4.59 |
| | එම | 5,000 | 0 | අංක 9, මහ සභාව | 8. 6.59 |
| | එම | 10,000 | 0 | අංක 10, මහ සභාව | 13. 7.59 |
| ඊ. 5 (සී) | වතුරබෙදීම, නඩත්තුව | 2,000 | 0 | අංක 8, මහ සභාව | 9. 3.59 |
| | එම | 500 | 0 | අංක 9, මහ සභාව | 8. 6.59 |
| | එම | 7,500 | 0 | අංක 10, මහ සභාව | 13. 7.59 |
| ඊ. 5 (ඊ) | ලිං කැපීම | 1,000 | 0 | අංක 8, මහ සභාව | 9. 3.59 |
| | එම | 10,000 | 0 | අංක 10, මහ සභාව | 13. 7.59 |
| ඊ. 5 (අයි) | ජීවනාධාර | 2,000 | 0 | අංක 9, මහ සභාව | 8. 6.59 |
| ඊ. 6 (ජී) | ආරෝග්‍යශාලා | 6,000 | 0 | අංක 10, මහ සභාව | 13. 7.59 |
| ඊ. 7 (ඩී) | වෙළඳපොල තැනීම | 12,000 | 0 | අංක 10, මහ සභාව | 13. 7.59 |
| ජේ. 1 (ඩී) | විදුලිබලය මිලට ගැනීම | 30,000 | 0 | අංක 10, මහ සභාව | 13. 7.59 |
| ජේ. 2 (සී) | මීටර් යනාදි උපකරණ | 4,000 | 0 | අංක 10, මහ සභාව | 13. 7.59 |
| ජේ. 2 (ඩී) | තඹකම්බියනාදිය | 2.500 | 0 | අංක 10, මහ සභාව | 13. 7.59 |
| ජේ. 3 (ඒ) | ගෘහයනට යාකිරීම ද්‍රව්‍ය | 7,000 | 0 | අංක 10, මහ සභාව | 13. 7.59 |
| ජේ. 4 (බී) | වැටුප් ... | 6.500 | 0 | අංක 10, මහ සභාව | 13. 7.59 |
| ජේ.4(එෆ්.) | ගමන් ගාස්තු | 100 | 0 | අංක 10, මහ සභාව | 13. 7.59 |
| ජේ. 6 | දිගුකිරීම ... | 28,700 | 0 | අංක 5, මහ සභාව | 17. 4.59 |
| ඇම. 1 | කියවීම් ශාලා පඩිනඩි | 550 | 0 | අංක 9, මහ සභාව | 8. 6.59 |
| ඇම. 2 | කියවීම්ශාලා පොත්පත් යනාදිය | 3,000 | 0 | අංක 9, මහ සභාව | 8. 6.59 |
| ඇම. 3 | කියවීම්ශාලා ලී බඩු | 2,000 | 0 | අංක 9, මහ සභාව | 8. 6.59 |
| ඇම. 4 | කියවීම්ශාලා නඩත්තුව | 200 | 0 | අංක 9, මහ සභාව | 8. 6.59 |
| | | 207,800 | 0 | | |

වර්ෂ 1959ක්වූ මාර්තු මස 9 වෙනි දින, අප්‍රේල් මස 17 වෙනි දින, ජූනි මස 8 වෙනි දින සහ ජූලි මස 13 වෙනි දිනයන්හි කොලොන්නාව නගර සභාවේ පවත්වන ලද මාසික රැස්වීම්වලදී පිළිගෙන ස්ථිර කරන ලදි.

කොලොන්නාව නගර සභා කාර්යාලය,
වැල්ලම්පිටිය, 1959 අගෝස්තු මස 1 වෙනි දින,

සී. අමරසිංහ,
කොලොන්නාව නගර සභාපති.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරනු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිඬ කරන්නාගේ වගකීම පිට්ය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඬ කරනු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා **1955 ජනවාරි 1** වැනි දින සිට අය කරන ගාස්තු මෙසේයි :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට | ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් **කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කායඝීංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | | රු. | ශ. |
|---|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... | එක් කාණ්ඩයක් සඳහා | ... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට | ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිට පතකට ... ... | ... | ... | 25 | |
| | තැපැල් ගාස්තුවත් සමග | ... | 31 | |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | ... | ... | 10 | |
| | තැපැල් ගාස්තුවත් සමග | ... | 14 | |

15. පරණ ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. **මෙය කොළඹ රජයේ ප්‍රකාශන කායඝීංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.**

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී